# අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට

**2023 වසර මැද අයවැය තක්සේරුව**

**2023 ඔක්තෝබර්**

**© Verité Research**

# අන්තර්ගතය


අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට .......... 4

ඇගයීම් ක්‍රමවේදය .......... 4

විවෘතභාවය .......... 4

ප්‍රගතිය .......... 5

සොයා ගැනීම් විස්තරාත්මකව .......... 8

වගකීම්භරණය .......... 27

# අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට

**"අයවැය පොරොන්දු: මැතිසබයෙන් ඔබ්බට"** යනු අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන ඩෑෂ්බෝඩයක් වේ.

2017 වර්ෂයේදී හඳුන්වාදුන් මෙම ඩෑෂ්බෝඩය වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම අරමුණු කරගෙන ඇත.

- රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩෑෂ්බෝඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

1. රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
2. අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

2023 අර්ධ වාර්ෂික ඇගයීමේදී 2023 අයවැයෙන් යෝජනා කල වියදම් යෝජනා 25 ක් සහ ප්‍රතිපත්ති යෝජනා 7 ක් ඇගයීමට ලක් කෙරුණි. වියදම් යෝජනා සඳහා ප්‍රතිපාදන සහ ප්‍රමාණාත්මක ප්‍රථිපල තිබුණු අතර ප්‍රතිපත්ති යෝජනා ඵලදායී වීම සඳහා නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) අවශ්‍ය විය.

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම ඩෑෂ්බෝඩය එම යෝජනා විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙක භාවිතයෙන් ඇගයීමට ලක් කරන ලදී. අර්ධ වාර්ෂික ඇගයීම මඟින් අදාළ වසරේ පළමු මාස හය සඳහා වන යෝජනා වල ප්‍රගතිය සහ විවෘතභාවය ඇගයීම් කෙරේ.

පර්යේෂණ කණ්ඩායම මෙම යෝජනා වලට අදාළ තොරතුරු ප්‍රගාමීව අන්තර්ජාලයට එක් කර ඇත්දැයි පරීක්ෂා කළ අතර, මූලික වශයෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා වන පනත හරහා නියෝජිතායතනවල ගොනු කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත් වලින් තොරතුරු රැස්කර ගෙන ඇත. 2023 අර්ධ වාර්ෂික ඇගයීම සඳහා මෙම ඉල්ලුම්පත් 2023 ජූලි 26, අගෝස්තු 10 සහ 15 යන දින වල ගොනුගත කරන ලදී. වැඩ කරන දින 21 ක කාලයක් පුරා නියෝජිතායතන වෙතින් ඇගයීම් සඳහා තොරතුරු භාරගන්නා ලදී. මෙම කාලසීමාවට පසුව ලැබුණු කිසිදු තොරතුරක් ඇගයීම සඳහා සලකා බලනු නොලැබීය.

## විවෘතභාවය

මෙම දර්ශකය රජය විසින් තමන් කුමක් කරන්නේදැයි, පවසන ප්‍රමාණය ඇගයීමකට ලක් කෙරේ. එමගින් එක් එක් යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු රජය විසින් අනාවරණය කිරීමේ මට්ටම මනිනු ලැබේ. කෙටියෙන් ගත් කල මෙම දර්ශකය මගින් විනිවිදභාවය ඇගයීමකට ලක් කෙරේ.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුල යෝජනාවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළි කිරීමේ ප්‍රවණතාව ඇසුරෙන් විවෘතභාවය ඇගයීමට ලක් කරනු ලැබේ. වාර්ෂික ඇගයීමේදී, සම්පූර්ණ වසර සඳහා වන වියදම් සහ ප්‍රතිපත්ති යෝජනාවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළි කිරීමේ ප්‍රවණතාව ඇසුරෙන් විවෘතභාවය ඇගයීමට ලක් කරනු ලැබේ.

ඇගයීම සිදු කරන වේලාවේ ලැබී ඇති තොරතුරු මත පදනම්ව විවෘතභාවය ඇගයෙන අතර එය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | | |
|---|---|---|
| | ආවෘත | කිසිදු තොරතුරක් නොමැත. |
| | සීමිත | ප්‍රගතිය ඇගයීමට තොරතුරු ප්‍රමාණවත් නොමැත. |
| | උදාසීන | ප්‍රගතිය පිලිබඳ තොරතුරු ලබාගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. |
| | සාධනීය | ප්‍රගතිය පිලිබඳ තොරතුරු අදාල කාලය තුල ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිවිය. |
| | විවෘත | පොරොන්දුවේ සමස්ත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත. |

## ප්‍රගතිය

මෙම දර්ශකය මගින් රජය තමන් කරන්නේ යැයි පවසන දේ කෙතරම් දුරට ඉටු කරන්නේද යන්න ඇගයීමකට ලක් කරනු ලැබේ. ස්ථාපිත කාල රේඛාවන් සහ සන්ධිස්ථාන මත පදනම්ව යෝජනා සහ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ ලා රජයේ ප්‍රගතිය ඇගයීමට ලක් කරයි.

වියදම් යෝජනා සඳහා අර්ධ වාර්ෂික ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | | |
|---|---|---|
| | **හෙළි කර නැත** | ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත |
| | **අතහැර දමා ඇත** | මෙම පොරොන්දුව තක්සේරු කිරීමේ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත |
| | **නොසලකා හැර ඇත** | මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත |
| | **මන්දගාමී ප්‍රගතියක් ඇත** | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදුකිරීමට අසමත් වී ඇත. |

| | |
|---|---|
| **සතුටුදායක ප්‍රගතියක් ඇත** | මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත[1] |

වියදම් යෝජනා සඳහා වාර්ෂික ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | |
|---|---|
| **හෙළිකර නැත** | ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත/ ප්‍රයෝජනයට ගත නොහැක |
| **අතහැර දමා ඇත** | වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත |
| **දුර්වලයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |
| **අර්ධ සම්පූර්ණයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| **සැළකිය යුතුයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |
| **සම්පූර්ණයි** | ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

ප්‍රතිපත්ති යෝජනා සඳහා ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කරන ලදී.

| | |
|---|---|
| හෙළිකර නැත | කිසිදු තොරතුරක් නොමැත හෝ ලද තොරතුරු භාවිතා කළ නොහැක. |
| ක්‍රියාත්මක කර නැත | යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර නොමැත. මේ බව අදාල අමාත්‍යාංශය විසින් ලිඛිතව තහවුරු කර ඇත. |
| අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | යෝජනාවේ ඇතැම් කොටස් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර ඇත. |

---

[1] යෝජනාවක් සතුටුදායක ප්‍රගතියක් ලබා ඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජූනි 30 වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

| | | |
|---|---|---|
| ✓ | සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත | ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සියලුම කොටස් සඳහා අවශ්‍ය නීතිගතකිරීම් සහ නියාමන දැනුම්දීම් (ගැසට්පත්‍ර) ප්‍රකාශයට පත්කර ඇත. තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. |

# සොයා ගැනීම් විස්තරාත්මකව

**වියදම් යෝජනා**

| අයවැය පොරොන්දුව | විවෘතභාවය | ප්‍රගතිය | රජයේ නියෝජිතායතනය |
|---|---|---|---|
| සමෘද්ධි,වැඩිහිටි, විවිධ අවශ්‍යතාඇති පුද්ගලයින්ගේ හා වකුගඩු රෝගීන්ගේ දීමනාවල ප්‍රතිලාභීන්ට ගෙවනු ලබන වැඩි කරන ලද දීමනා අඛණ්ඩව ලබා දීම | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය. කෙසේ වෙතත්, 2023 ජනවාරි මාසය සඳහා සමෘද්ධි සහනාධාරලාභීන් සහ ඔවුන් වෙත ලබා දුන් මුදල් සම්බන්ධ විස්තර ඇතුළත්ව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2023.02.06 දිනැති චක්‍රලේඛයක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි විය. මෙම චක්‍රලේඛය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය සහ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය සමඟ බෙදා ගන්නා ලදි. කෙසේ වෙතත්, වැඩිදුර තොරතුරු කිසිවක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 15 වන දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද නමුදු ඊට අදාළ පසු විපරම් කිහිපයක්ම සිදු කළද ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| ගංවතුර නිසා හානියට පත් වූ මාර්ග සහ පාළම් ප්‍රතිසංස්කරණය හා ඉදිකිරීම | **සීමිත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය. කෙසේ වෙතත්, පහත ව්‍යාපෘතිවලට අදාළ ලංසු ලේඛන අන්තර්ජාල ඔස්සේ ලබා ගත හැකි විය: 1. කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට-මාගම්මන මාර්ගය ඔස්සේ කැළණි ගඟ හරහා ගරගොඩ පාලම නැවත ඉදි කිරීම (මාර්ග සංවර්ධන අධිකාරි නොවන); 2. රජමාවත විහිදුම් මාර්ගය ඉදි කිරීම.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2023 අගෝස්තු 23 දින ලැබිණ. ඒ, තොරතුරු දැන ගැනීමේ ඉල්ලීම ගොනු කොට දින 14කට පසුව, එහෙත් දින 21ක් ඇතුළත විය. 2023 පළමු කාර්තු දෙක සඳහා මෙම යෝජනාව යටතේ අදාළ වන ඇතැම් උප-ව්‍යාපෘතිවල මූල්‍ය ඉලක්ක සහ කාර්යසාධනය සම්බන්ධයෙන් තොරතුරු ලැබිණ. කෙසේ වෙතත්, ආසන්න වශයෙන් මුළු වෙන් කිරීමෙන් 50%ක් පමණ වන ඉලක්ක හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු නොලැබිණ. මේ නිසා, ලබා දෙන ලද තොරතුරු මෙම පොරොන්දුවෙහි සමස්ථ ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නොවීය. | **හෙළිකර නැත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br>මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයට ලැබුණු ප්‍රතිචාරයට අනුව, මේ සඳහා වෙන් කරන ලද සම්පූර්ණ මුදල් වටිනාකම වූ රු. මිලියන 2,000 ක මුදල පළාත්/කොට්ඨාස අනුව කාණ්ඩ පහකට බෙදා ඇත: ඉදිකිරීම් කොට්ඨාසය (රු. මිලියන 900), සබරගමුව පළාත (රු. මිලියන 397.14), මධ්‍යම පළාත (රු. මිලියන 449.99), ඌව පළාත (රු. මිලියන 83.05) සහ දකුණු පළාත (රු. මිලියන 169.79) යනාදී වශයෙනි. පළාත් හතර යටතේ දියත් කරන ලද ඇතැම් උප-ක්‍රියාකාරකම්හි ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු ලබා දී තිබුණද, ඉදිකිරීම් කොට්ඨාසය යටතේ වෙන් කරන ලද මුදල්වලට අදාළව භෞතික ඉලක්ක/ප්‍රගතිය සහ මූල්‍ය ඉලක්ක/ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ලබා දෙනු නොලැබිණ. මුළු වෙන් කිරීමෙන් ආසන්න වශයෙන් 50%ක් පමණ වන ඉදිකිරීම් කොට්ඨාසයේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | මාර්ග සංවර්ධන අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| ළමා පෝෂණය වැඩි කිරීම | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කරන ලද නමුත් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ඒ සඳහා ප්‍රතිචාරයක් නොලැබිණ. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීම | **සාධනීය**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර ඊට අදාළව තොරතුරු 2023 අගෝස්තු 21 දින ලබා දෙන ලදි. එකී ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත ප්‍රගතිය ඇගයීමට අදාළ සහ ප්‍රයෝජනවත් තොරතුරු ලැබිණි. | **සතුටුදායක ප්‍රගතියක් ඇත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයට, අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබුණු ප්‍රතිචාරයට අනුව මෙම ව්‍යාපෘතිය උපායමාර්ගගත කර ඇති අතර භෞතික හා මූල්‍ය ඉලක්කදව ඇතුළත්ව 2023 මාර්තු-දෙසැම්බර් කාල සීමාව සඳහා ඉලක්ක පිහිටුවා තිබේ (මෙම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් මාසය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ය).<br><br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් 2023 ජූනි මාසය දක්වා සත්‍ය භෞතික හා මූල්‍ය ප්‍රගතියට අදාළ තොරතුරු ද ලබා දෙන ලදි. එම තොරතුරුවලට අනුව, 2023 ජූනි මාසය සඳහා පිහිටුවා ඇති භෞතික ඉලක්කය 20%ක් වන අතර එම 20% ඉලක්කය හා සැසඳීමේදී 40%ක ප්‍රගතියක් සාක්ෂාත් කර ගනිමින් ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගති ඉලක්ක ඉක්මවීමට හැකි වී තිබේ. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් සැලකිය යුතු බිඳ වැටීමක් දක්නට ලැබෙන අතර ඉලක්කගත රු. මිලියන 98න් වියදම් කර ඇත්තේ රු. මිලියන 6.28ක් පමණි. මූල්‍ය ප්‍රගතිය 6.4%ක් වන අතර ඉන් ගම්‍ය වන්නේ ව්‍යාපෘතියෙහි වැය කිරීම, 2023 ජූනි මාසය වන විට සැලසුම් කර තිබුණු අයවැයගත වැය කිරීමට වඩා බෙහෙවින් පහත මට්ටමක පවතින බවයි.<br><br>ඒ අනුව, සමස්ථ ප්‍රගතිය 103% කි. | වාරිමාර්ග අමාත්‍යාංශය |
| විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා නව ආර්ථික කලාප | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද නමුදු පසු විපරම් කිහිපයක්ම සිදු කරන ලද නමුත් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණ. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| කුටුම්භ ව්‍යවසායකයන් ලෙස වැඩිහිටියන්/ ආබාධිත පුද්ගලයන්/ වැන්දඹුවන් ශක්තිමත් කිරීම | **සීමිත** | **හෙළිකර නැත** | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කරන ලද අතර 2023 අගෝස්තු 22 දින තොරතුරු තොරතුරු ලැබිණි. ඒ, අදාළ ඉල්ලීම ගොනු කොට දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත විය. කෙසේ වෙතත්, ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීය. | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කියාත්මක කිරීමේ ආයතනය වෙතින් තොරතුරු ඉල්ලුම්පත්‍රයට ලැබුණු පළමු ප්‍රතිචාරයට අනුව සඳහන් වූයේ පොරොන්දුව ක්‍රියාත්මක කිරීම උදෙසා අරමුදල් ලබා දීම සම්බන්ධයෙන් විමසීමක් 2023 ජූනි 16 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද බවයි. කෙසේ වෙතත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත ප්‍රතිචාර දක්වා නොතිබුණි. එසේම, ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශ 61ක ප්‍රතිලාභීන් 610ක් වෙත ණය ලබා දීමට අපේක්ෂිතව තිබේ.<br><br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය (කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය) වෙතින් ලද දෙවැනි ප්‍රතිචාරයට අනුව, පළමු තොරතුරු ඉල්ලීම ආයතන තුනක් වෙත යොමු කර තිබුණි. එනම්: වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතන තුනයි. යොමු කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය විසින් ප්‍රතිචාර දක්වා තිබුණේ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යාලය වෙත අරමුදල් වෙන් කොට තිබුණු බව සඳහන් කරමිනි. ආබාධිත පුද්ගලයන්ගේ ව්‍යාපාර ව්‍යාප්ත කරනු පිණිස ආබාධිත තැනැත්තන් 100 දෙනෙකු සඳහා ආධාර ලබා දීමට අපේක්ෂිතව තිබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලම වෙත ලැබුණු අයදුම්පත් මේ වන විට ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා සැකසෙමින් පවතී. මෙම වැඩසටහන 2023 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ය.<br><br>යොමු කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද තොරතුරු ඉහත කී පොරොන්දුවට අදාළ සුවිශේෂී තොරතුරු නොවූ අතර එබැවින් ප්‍රගතිය ඇගයීමට යොදා ගත නොහැක.<br><br>අදාළ ආයතන වෙතින් ලබා දෙන ලද තොරතුරුවල ස්වභාවය සලකා බැලීමේදී මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීමට ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීය. | |

| | | | |
|---|---|---|---|
| කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 10ක් ස්ථාපිත කිරීම | **සාධනීය**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර 2023 අගෝස්තු 21 දින තොරතුරු ලැබිණ. ඒ, අදාළ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත විය. කෙසේ වෙතත්, ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීය. | **සතුටුදායක ප්‍රගතියක් ඇත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>ගොනු කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ලද ප්‍රතිචාරයට අනුව මෙම ව්‍යාපෘතිය උපායමාර්ගගත කර ඇති අතර භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් වන පරිදි 2023 තුන්වැනි හා හතරවැනි කාර්තු දෙක සඳහාම ඉලක්ක පිහිටුවා ඇත. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය 2023 ජූනි 01 වන දින අනුමත කර ඇති අතර 2023 ජූලි මාසයෙන් ආරම්භ වන මාස හයක කාල පරිච්ඡේදය සඳහා කාර්ය සැලැස්මක් පිළියෙළ කර තිබේ.<br><br>මීට අමරතව, ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් ලබා දෙන ලද තොරතුරුවලට අනුව, මුලින් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබුණු රු. මිලියන 250ක මුදල රු. මිලියන 190 දක්වා සංශෝධනය කර ඇති බව අවධාරණය කෙරේ. අයවැය කතාවට අනුව කෘෂි-ව්‍යවසායක ගම්මාන 10ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද සංශෝධිත කාර්ය සැලැස්මට අනුව කෘෂි-ව්‍යවසායකත්ව ගම්මාන 11ක් පිහිටුවීමට අපේක්ෂිතව ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අනුව, මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන රාජ්‍ය ආයතනය වශයෙන් මහවැලි අධිකාරියයි. | වාරිමාර්ග අමාත්‍යාංශය |
| තරුණ කාන්තා ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමය | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හඳුනා ගන්නා ලදි. ඒ අනුව, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් 2023 ජූලි 26 දින සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් යොමු කරන ලදි. කෙසේ වෙතත්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ඊට දැක්වූ ප්‍රතිචාරය වූයේ ඉහත කී අයවැය පොරොන්දුව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද්දක් බැවින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම උදෙසා එකී අමාත්‍යාංශය වෙත තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමක් යොමු කරන ලෙසයි. මේ අනුව, 2023 අගෝස්තු 18 දින කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය වෙත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් යොමු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කරන ලද නමුදු ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |

<table>
<tr><td rowspan="2">ආයෝජන හිතකර පරිසරය</td><th>සාධනීය</th><th>මන්දගාමී ප්‍රගතියක් ඇත</th><td rowspan="2">ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය</td></tr>
<tr><td>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර 2023 අගෝස්තු 16 දින ඊට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලැබිණ. ඒ, අදාළ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත විය. එලෙස ලබා දෙන ලද තොරතුරු ඇගයීමට අදාළ තොරතුරු විය.</td><td>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ලද ප්‍රතිචාරයට අනුව, මෙම ව්‍යාපෘතිය උපායමාර්ගගත කර ඇති අතර ඒ ඒ ව්‍යාපෘති කාර්යයට අදාළ කාර්තුමය භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් වන පරිදි 2023 වසර සඳහා කාර්ය සැලැස්මක් පිළියෙළ කොට තිබේ. මේ සඳහා වෙන් කර ඇති රු. මිලියන 200 ක මුදල කොටස් දෙකකට බෙදා දක්වා තිබේ: පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 50ක් සහ ඉතිරි රු. මිලියන 150 විවිධ ක්‍රියාකාරකම් සඳහා වශයෙනි. මෙම රු. මිලියන 150 සඳහා සැලසුම් කර ඇති කාර්යයන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කරන ලද කාර්ය සාධක බලකායක් විසින් ක්‍රියාත්මක කරනු ඇත. දෙවන කාර්තුව සඳහා පිහිටුවා  ඇති මූල්‍ය ඉලක්ක ලබා දී ඇත්තේ උප-ක්‍රියාකාරකම් හයක් අතරින් හතරකට අදාළව පමණක් වන අතර මූල්‍ය ප්‍රගතිය ලබා දී ඇත්තේ උප ක්‍රියාකාරකම් හය අතරින් එකක් සඳහා  අදාළ වන පරිදි පමණි. දෙවන කාර්තුව සඳහා සැලසුම් කර ඇති භෞතික ඉලක්ක ක්‍රියාකාරකම් සියල්ලටම අදාළව ලබා දී ඇති අතර, භෞතික ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ලබා දී ඇත්තේ ක්‍රියාකාරකම් හය අතරින් දෙකක් සඳහා පමණි. මේ අනුව, ලබා දී ඇති තොරතුරුවලට අනුව, අදාළ ඉලක්කවලට සාපේක්ෂව භෞතික ප්‍රගතියේ සාමාන්‍යය 30%ක් වූ අතර මූල්‍ය ප්‍රගති සාමාන්‍යය 2%ක් විය.<br><br>ඒ අනුව සමස්ථ ප්‍රගතිය 16%ක් වී ඇත.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුවක් | **ආවෘත** | **හෙළිකර නැත** | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කෙසේ වෙතත්, කුරුඳු වගාව සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට අදාළ කබිනට් අමාත්‍ය මණ්ඩල තීන්දුවක් 2023.08.14 දින ගන්නා ලදි (කැබිනට් තීන්දු අංක 8). මේ අනුව, ‘කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව’ නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ගරු ජනාධිපතිවරයා සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාමූහිකව ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. මේ සම්බන්ධයෙන් ගොනු කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමකට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් කිසිදු තොරතුරු නොලැබුණි.<br><br>2023 අයවැයෙන් හඳුන්වා දෙන ලද අයවැය පොරොන්දුවට අදාළ ඒ ඒ ක්‍රියාත්මක කිරීමේ ආයතන සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටිමින් 2023 ජූලි 06 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කරන ලද අතර මෙම පොරොන්දුව සඳහා අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් කුරුඳු කර්මාන්ත දෙපාර්තමේන්තුව හඳුනා ගන්නා ලදි. කෙසේ වෙතත්, අන්තර්ජාලය ඔස්සේ හෝ විවිධ රාජ්‍ය ආයතන සමඟ දුරකතන මාර්ගයෙන් සිදු කරන ලද පසු විපරම් සංවාදයන්හිදී එවැනි දෙපාර්තමේන්තුවක පැවැත්ම පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි විය. ඒ අනුව, 2023 අගෝස්තු 15 දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් යොමු කරන ලද නමුදු පසු විපරම් කිහිපයක්ම සිදු කළද එම අමාත්‍යාංශයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | |
| ග්‍රාමීය පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම | **ආවෘත** | **හෙළිකර නැත** | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කළද අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | |

| | | | |
|---|---|---|---|
| නව වෛද්‍ය පීඨයක් | **ආවෘත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කෙසේ වෙතත්, රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අති විශේෂ ගැසට් නිවේදනයකට අනුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨයක් පිහිටුවීම එහි පස්වන පීඨය වශයෙන් නිල වශයෙන් ගැසට් කර තිබේ. 2023 මාර්තු 20 දින නිකුත් කරන ලද අංක 2324/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි මෙම නිවේදනය ඇතුළත් වේ. අභිනවයෙන් ස්ථාපිත පීඨය සඳහා පීඨාධිපතිවරයෙකු පත් කිරීම සනාථ කරමින් එම පීඨය සඳහා නිල වෙබ් අඩවියක්ද ආරම්භ කර තිබේ. එමෙන්ම, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර විසින් සිදු කරන ලද කථාවකදී සඳහන් කෙරුණේ අයවැයෙන් වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන, ඉඩම් අත්පත් කර ගැනීමද ඇතුළත්ව වෛද්‍ය පීඨය පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු සඳහා යොදා ගැනෙනු ඇති බවයි.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කරන ලද නමුදු අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබුණි. | **හෙළිකර නැත**<br><br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| විද්‍යුත් ක්‍රමවේදය මඟින් ගෙවීම් කිරීම ප්‍රවර්ධනය | **සාධනීය**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කෙසේ වෙතත්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) නිල වෙබ් අඩවියෙහි පළ කර ඇති මාසික අධීක්ෂණ වාර්තාව (MMR) මඟින් 'ඉලෙක්ට්‍රොනික ගෙවීම් ද්වාරය' හඳුනා ගැනෙනුයේ තාක්ෂණ අමාත්‍යාංශයේ සහ ICTA හි ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘතියක් ලෙසයි. එහි, 2023 අප්‍රේල් 30 වන විට ව්‍යාපෘතියේ ප්‍රගතියද මෙලෙස වාර්තා කර ඇත: "කෙටුම්පත් සංකල්ප සටහන ICTA විසින් පිළියෙළ කරන ලදුව තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම සංකල්ප සටහනට අනුව, මෙම සමස්ථ විසඳුම අදියර තුනකින් සමන්විත වේ. රජයේ ආයතන වෙත මූලික අන්තර්ජාල ගනුදෙනු පහසුකම් ලබා දීමේ හැකියාව සාකච්ඡා කරනු පිණිස 2023 මැයි 15 දින බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ රැස්වීමක් පැවැත්වෙනු ඇත".<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර 2023 අගෝස්තු 09 දින ඊට අදාළව තොරතුරු ලැබිණ. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14ක් ඇතුළත විය. එලෙස ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් විය. | **මන්දගාමී ප්‍රගතියක් ඇත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලද ප්‍රතිචාරයට අනුව, අගෝස්තු 01 දින වන විට භෞතික ප්‍රගතිය හා කාර්ය සැලැස්මක් ඇතුළත් පිටු තුනක ලේඛනයක් අප හා බෙදා ගන්නා ලදි. ප්‍රගති වාර්තාවෙහි ලබා දෙන ලද තොරතුරුවලට අනුව, දෙවන කාර්තුව අවසානය වන විට හෝ දෙවන කාර්තුව ඇතුළත සම්පූර්ණ කිරීමට අපේක්ෂිතව තිබුණු ක්‍රියාකාරකම් කිහිපයක්ම අගෝස්තු 01 වන විට සම්පූර්ණ කර නොතිබුණි. 2023 ජනවාරි සිට ජූනි මාසය දක්වා කිසිදු වියදමක් සිදු වී නොමැති බවත්, 2023 අයවැය කතාවෙන් වෙන් කර ඇති රු. මිලියන 200 මෙම විසඳුම සංවර්ධනය කිරීම වෙනුවෙන් යොදා නොගැනෙනු ඇති බවත් එම ප්‍රතිචාරයෙන් අවධාරණය කෙරේ. | තාක්ෂණ අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| පසු අස්වනු වගා හානි අඩු කිරීම හා ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම | **සීමිත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 15 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2023 සැප්තැම්බර් 04 දින ලැබුණි. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14ක් ඇතුළත ය. කෙසේ වෙතත්, ලබා දෙන ලද එම තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නොවීය. | **හෙළිකර නැත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබුණු ප්‍රතිචාරයට අනුව, ඒ ඒ ව්‍යාපෘති කාර්යයට අදාළ කාර්තුමය භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් කාර්ය සැලසුම් හා සංශෝධිත කාර්ය සැලසුම් කිහිපයක්ම 2023 සඳහා පිළියෙළ කොට තිබේ. කෙසේ වෙතත්, අප වෙත තොරතුරු ලැබී ඇති ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති මුදල් රු. මිලියන 150ක් වූ මුළු අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට සමාන නොවන අතර එම රු. මිලියන 150ක මුළු වෙන් කිරීම සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් අප වෙත ලබා දී නොමැත. සංශෝධිත කාර්ය සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති මුළු මුදල රු. මිලියන 45.8 ක් වේ.<br><br>මීට අමතරව, 2023.07.31 දින වන විට භෞතික හා මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා ලබා දී ඇත. ඒ අනුව, භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023 ජූලි මස අග දක්වා ලබා දී ඇති අතර භෞතික හා මූල්‍ය ඉලක්ක සම්බන්ධ තොරතුරු ජූනි මාසය අග (දෙවන කාර්තුව) දක්වා ලබා දී ඇත. ප්‍රගති වාර්තා ලබා දී ඇත්තේ නිශ්චය කර ඇති ඉලක්ක (දෙවන කාර්තුව සඳහා ජූනි මස අවසානය) වලට වඩා පසු දිනක් සඳහා පිළියෙළ කර ඇති හෙයින් එමඟින් පරස්පර විරෝධී තත්ත්වයක් උද්ගත වේ. මෙම කාලමය නොගැලපීම නිසා දෙවන කාර්තුව අවසානය වන විට ප්‍රගතිය තක්සේරු කිරීමේදීද අභියෝග මතු කෙරේ. ප්‍රගති වාර්තා මඟින් දෙවන කාර්තුව ඉක්මවා යන කාල පරිච්ඡේදයක් ආවරණය වීම ඊට හේතුවයි. මේ නිසා, පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීමට නොහැකි විය. | කෘෂිකර්ම අමාත්‍යංශය |
| කෘෂිකර්මාන්තය තුළ තරුණයන් රඳවා ගැනීම | **සීමිත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 15 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2023 සැප්තැම්බර් 04 දින ලැබුණි. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14ක් ඇතුළත ය. කෙසේ වෙතත්, ලබා දෙන ලද එම තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නොවීය. | **හෙළිකර නැත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරයට අනුව, ඒ ඒ ක්‍රියාකාරකමට අදාළ කාර්තුමය භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් කාර්ය සැලැස්මක් 2023 වසර සඳහා පිළියෙළ කර තිබේ. කෙසේ වෙතත්, අප වෙත තොරතුරු ලැබුණු ක්‍රියාකාරකම් සඳහා සිදු කර ඇති මුදල් වෙන් කිරීම රු. මිලියන 120ක් වූ මුළු අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට සමාන නොවන අතර එම රු. මිලියන 120 මුළු ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් තොරතුරු ලබා දී නොමැත. එසේම, ඉලක්කවලට සාපේක්ෂව යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා එහි මූල්‍ය හෝ භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන්ද තොරතුරු ලබා දී නොමැත. මේ නිසා, තොරතුරු නොමැති වීම හේතුවෙන් පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීමට නොහැකි විය. | කෘෂිකර්ම අමාත්‍යංශය |

<table>
<tr><td rowspan="2">විදේශ වෙළඳාම හා ආයෝජනය සම්බන්ධ නියෝජිතායතනය</td><td>ආවෘත</td><td>හෙළිකර නැත</td><td rowspan="2">ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය</td></tr>
<tr><td>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කරන ලද නමුදු අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි.</td><td>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය.</td></tr>
<tr><td rowspan="2">ජාතික ඵලදායිතා කොමිෂන් සභාව</td><td>ආවෘත</td><td>හෙළිකර නැත</td><td rowspan="2">කර්මාන්ත අමාත්‍යාංශය</td></tr>
<tr><td>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කෙසේ වෙතත්, ජාතික ඵලදායිතා  කොමිසමක් පිහිටුවීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණයකට 2023.08.14 දින එළැඹෙන ලදි. ඒ අනුව, එකී යෝජිත ජාතික ඵලදායිතා කොමිසමේ ආයතන ව්‍යුහය තීරණය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙන් ගරු. ජනාධිපතිවරයා විසින් සිදු කරන ලද යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබේ. එමෙන්ම, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයකට අනුව, මෙම ක්‍රියාදාමය කාර්යක්ෂම කරනු වස් අන්තර්-අමාත්‍යාංශ ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවන ලද අතර එය විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන/සංවිධානවල සාමාජිකයන්ගෙන් සමන්විත වේ. එහි මූලික පරමාර්ථය වනුයේ ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් ගෝලීය වශයෙන් පිළිගත් හොඳම පරිචයන් සොයා බැලීමයි. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම උදෙසා රජය ඕස්ට්‍රේලියානු ඵලදායිතා කොමිසම සමඟද කටයුතු කර තිබේ. දැනුම හා විදසුන් පෝෂණය කිරීමේ අරමුණින් ඕස්ට්‍රේලියානු ඵලදායිතා කොමිසම 2023 අප්‍රේල් 27 දින ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම වෙනුවෙන් මාර්ගගත සැසියක් සංවිධානය කරන ලද අතර එහි සත්කාරකත්වය දරන ලද්දේ ජනාධිපති ලේකම් කාර්යාලය විසිනි. පොරොන්දුවෙහි ප්‍රගතියඇගයීම සඳහා අදාළ කාර්ය සැලසුම් හෝ ප්‍රගති වාර්තා සම්බන්ධ කිසිදු වැඩිදුර තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි නොවීය.<br><br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් කර්මාන්ත අමාත්‍යාංශය හඳුනා ගන්නා ලදි. ඒ අනුව, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් 2023 ජූලි 26 දින කර්මාන්ත අමාත්‍යාංශය වෙත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් යොමු කරන ලදි. කෙසේ වෙතත්, 2023 අගෝස්තු 10 දිනැති කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිචාරයකටට අනුව (ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14ක් ඇතුළත) සඳහන් කෙරුණේ ‘ජාතික ඵලදායිතා කොමිසමක්’ පිහිටුවීමේ අයවැය යෝජනාව කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණ පරාසයට අදාළ නොවූ බවයි. 2023.03.28 දිනැති ලිපියක් මඟින් ඒ බව ජනාධිපති ලේකම් කාර්යාලය වෙතද සන්නිවේදනය කරන ලද බවද එම ප්‍රතිචාරයෙහි සඳහන් විය. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගන්නා ලද ක්‍රියාත්මක කිරීමේ ආයතනය මෙම යෝජනාව ඊට අදාළ නොවන බව සඳහන් කළ බැවින් මෙහි ප්‍රගතිය ඇගයීය නොහැකි විය.</td><td>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>ඊට අමතරව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගන්නා ලද ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් යොමු කිරීමට ප්‍රතිචාර වශයෙන් සඳහන් කෙරුණේ, මෙම පොරොන්දුවට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය ඔවුන් නොවන බවයි. මේ නිසා, වගකිව යුතු ක්‍රියාත්මක කිරීමේ ආයතනය හඳුනා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීය නොහැකි විය.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| විශ්වවිද්‍යාලවල උපාධි සඳහා තත්ත්ව සහතික හා ප්‍රතීතන මණ්ඩලයක් | **සාධනීය**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද ඊට අදාළ තොරතුරු 2023 අගෝස්තු 18 දින ලැබුණි. ඒ, ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත විය. එලෙස ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් විය. | **මන්දගාමී ප්‍රගතියක් ඇත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබුණු ප්‍රතිචාරයට අනුව, උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතිකකරණය හා සහතිකකරණය සඳහා කවුන්සිලයක් පිහිටුවීමට රජය කටයුතු කරමින් සිටී. කෙසේ වෙතත්, එම කවුන්සිලය මේ දක්වා පිහිටුවා නොමැත. විශ්වවිද්‍යාල පනත සඳහා සිදු කරන ලද සංශෝධන මේ වන වන විට පාර්ලිමේන්තු අවධියේ සමාලෝචනය කෙරෙමින් පවතී. මෙම තත්ත්වය හේතුවෙන්, අයවැය පොරොන්දුවෙහි දක්වා ඇති මෙම ක්‍රියාදාමය තවමත් ඉටු නොකර ඇත. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම | **විවෘත**<br><br>2023 වසර සඳහා වාර්ෂික කාර්ය සැලැස්ම ධීවර අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි වූ නිසා මේ සම්බන්ධ තොරතුරු ප්‍රගාමී වශයෙන් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2023 සැප්තැම්බර් 04 දින ලැබුණි. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව විය. එම ලබා දුන් තොරතුරු ප්‍රගතිය ඇගයීමට අදාළ හා ප්‍රයෝජනවත් විය. | **මන්දගාමී ප්‍රගතියක් ඇත**<br><br>පොරොන්දුවෙහි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා , 2023 වාර්ෂික කාර්ය සැලැස්ම ධීවර අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබුණු ප්‍රතිචාරයට අනුව, මෙම තොරතුරු අප වෙත ලැබිණ: 2023 ආරම්භක කාර්ය සැලැස්ම, සංශෝධිත කාර්ය සැලැස්ම, 2023 ජූනි 30 දක්වා ප්‍රගතිය, 2023 ජූලි 1 දක්වා ප්‍රගතිය සහ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු. ලබා දුන් තොරතුරු අතරට 2023 ජූනි මාසය අග වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ඇතුළත් විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් නොවීය. 2023 ජූනි මාසය අග වන විට භෞගික ප්‍රගතිය 5%ක් විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ලද ප්‍රතිචාරයෙහි, ප්‍රමාදයට හේතු වශයෙන් පහත කාරණා ඇතුළත් විය:<br>අංක 09/2022 අයවැය චක්‍රලේඛයට අනුව - 2023 වර්ෂය තුළ රාජ්‍ය වියදම් දැරීම සහ කළමනාකරණය කිරීම, අදාළ නව වියදම් බැඳීම් වලට ඇතුල් වීමට පෙර 2022 වසර කල් ඉකුත් වූ බිල්පත් පියවීමට දැඩි උපදෙස් ලබා දෙන ලදී. 2022 වසර සඳහා අතැති බිල්පත් වල මුළු වටිනාකම 2023 අප්‍රේල් අවසානය වන විට රු. මිලියන 175.68ක් විය. මේ නිසා, අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාද හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ප්‍රමාදයට ලක් විය.<br><br>මීට අමතරව, මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ධීවර අමාත්‍යාංශය වෙත දැනුම් දෙනු ලැබුවේ 2023 මාර්තු 2 දින පමණි. | ධීවර අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම | **උදාසීන** | **මන්දගාමී ප්‍රගතියක් ඇත** | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 04 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් 2023 සැප්තැම්බර් 15 දින තොරතුරු ලැබිණ. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21කට පසුව ය. එලෙස ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් විය. | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලැබුණු ප්‍රතිචාරයට අනුව, මෙම තොරතතුරු අප වෙත ලැබිණ: 2023 කාර්ය සැලැස්ම, භෞතික ප්‍රගති වාර්තාව (2023 ජූනි 30 දක්වා), මූල්‍ය සීමාකම් හේතුවෙන් අමතර අරමුදල් සඳහා කරන ලද ඉල්ලීම්, සංශෝධිත කාර්ය සැලැස්ම සහ ‘ද්‍රව කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම’ යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව. කිරි ගවයන් මිල දී ගැනීම උදෙසා අයවැය පොරොන්දුවෙන් වෙන් කරන ලද මුදල් සහ ස්වකීය ‘අභිජනන ව්‍යාපෘති’ අරමුදල් වෙතින් අමතර රු. මිලියන 15ක් උපයෝගී කර ගැනීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. එමෙන්ම, රු. මිලියන 165ක මුළු මුදලක් කරා ළඟා වීමේ අරමුණින් එය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අමතර රු. මිලියන 50ක අරමුදල් ඉල්ලීමක්ද කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. එසේම, එය රු. මිලියන 105.5ක අමතර මුදල් වෙන් කිරීමක්ද අපේක්ෂා කර තිබේ.<br><br>මීට අමතරව, මූල්‍යමය සීමාකම් හේතුවෙන් පහත දැක්වෙන ක්‍රියාකාරකම් නවතා දමා තිබේ: ගව පට්ටි නවීකරණය කිරීම, පට්ටිවල ඇති කරන ගවයන් වෙන්වෙන් තෘණබිම් සංවර්ධනය, ශුක්‍රාණු බෙදා හැරීමේ වාහන දෙකක් කුලියට ගැනීම සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. 2023 කාර්ය සැලැස්මෙහි කාර්තුමය භෞතික හා මූල්‍ය සැලසුම් දක්වා ඇති අතර දෙපාර්තමේන්තුව නිසි කලට කාර්ය සැලැස්මේ කටයුතු ආරම්භ කර ඇති නමුදු, පහත හේතූන් මත ව්‍යාපෘති ප්‍රගතියට බාධා ඇති වී තිබේ:<br><br>1. ආරම්භක ටෙන්ඩර් කැඳවීමේදී මිල ගණන් ඉදිරිපත් කර තිබුණේ එක් ලංසුකරුවෙකු පමණක් වන අතර එකී ලංසු කරුද නියමිත පරිදි අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් කිරි ගවයන් ආනයනය කිරීමට අදාළ ටෙන්ඩර් පටිපාටිය නැවත ආරම්භ කිරීමට සිදු විය. මීට අදාළ ටෙන්ඩර් ලේඛන 2023 සැප්තැම්බර් 11 දින විවෘත කිරීමට නියමිතව ඇත.<br><br>2. විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනය කිරීමට අදාළ ටෙන්ඩර් කාර්ය පටිපාටිය නිසි කාලයේදී ආරම්භ කර තිබුණු නමුදු මූල්‍ය සීමාකම් හේතුවෙන් වෙන් කර ඇති මුළු මුදලම කිරි ගවයන් ආනයනය කිරීම වෙනුවෙන් යෙදවීමට සිදු විය.<br><br>3. මූල්‍යමය සීමාකම් හේතුවෙන් මෙම කටයුතු නතර කිරීමට සිදු වී තිබේ - කිරි ගව පට්ටි නවීකරණය කිරීම, පට්ටිවල ඇති කරන ගවයන් සඳහා තෘණබිම් සංවර්ධනය, ශුක්‍රාණු බෙදා හැරීමේ වාහන දෙකක් කුලියට ගැනීම සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. | |

| | | | |
|---|---|---|---|
| දේශගුණික වෙනස්වීම් පිළිබඳව ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් | **ආවෘත** | **හෙළිකර නැත** | අධ්‍යාපන අමාත්‍යංශය |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කෙසේ වෙතත්, කාලගුණික වෙනස්වීම් සහ හරිත වර්ධනය ආශ්‍රිත ප්‍රගතිය පිළිබඳව මැයි මස 31 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ කාලගුණ වෙනස්වීම් ලේකම් කාර්යාලයේ නිලධාරීන් අතර පැවැති සාකච්ඡාවකදී හෙළිදරවු වූයේ ඉදිරි වසරේදී ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමට යෝජිත කාලගුණික වෙනස්වීම් පිළිබඳ විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් ලොව පිළිගත් විද්‍යාඥයින් 130ක් පමණ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට සහයෝගය දැක්වීමට ඉදිරිපත් වූ බවයි. එසේම, එම විශ්වවිද්‍යාලය සමඟ හවුල්කාරීත්වයක් ඇතිකර ගැනීමට Korea Exim Bank කැමැත්ත පළ කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රජය හා එම බැංකුව අතර සාර්ථක සම්මුතිගත වීම් ඇති වූ බවද එහිදී හෙළිදරවු විය. මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ඊට අදාළ භෞතික හෝ මූල්‍යමය ඉලක්ක හෝ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කළ නමුදු අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබුණි. | කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | |
| සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ නව රසායනාගාරයක් | **ආවෘත** | **හෙළිකර නැත** | සුරාබදු දෙපාර්තමේන්තුව |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 16 දින තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කළ නමුදු අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබුණි. | කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | |

| මාර්ග නඩත්තු අරමුදලක් ස්ථාපනය කිරීම | **සීමිත** | **හෙළිකර නැත** | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>කෙසේ වෙතත්, මාර්ග නඩත්තු අරමුදලක් පිහිටුවීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීන්දුවක් 2023.03.27 දින ගන්නා ලදි. ඒ අනුව, ප්‍රවාහන හා අධිවේගී මාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගනිමින් පර්ලිමේන්තු පනතක් ප්‍රකාරව මෙම යෝජිත අරමුදල පිහිටුවීමට කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදි.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර 2023 අගෝස්තු 18 දින ඊට අදාළව තොරතුරු ලැබිණ. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත විය. එලෙස ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීය. | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලද ප්‍රතිචාර ලිපියට අනුව, මාර්ග නඩත්තු අරමුදලක් පිහිටුවීමේ ඉහත කී පොරොන්දුව 2023 කාර්ය සැලැස්මට ඇතුළත් කර නොමැති නමුදු මෙම වසර අවසානයේදී සංශෝධිත කාර්ය සැලැස්මට එය ඇතුළත් කිරීමට අපේක්ෂිතව ඇත. කෙසේ වෙතත්, කාර්ය සැලැස්මෙන් එනමුදු, මාර්ග නඩත්තු අරමුදල පිහිටුවීමට අදාළව අවශ්‍ය පනත් සම්මත කර ගැනීමට අදාළ තොරතුරු ඉහත කී තොරතුරු දැන ගැනීමේ ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරයට ඇතුළත් විය. ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ලබා දී ඇත්තේ දෙවන කාර්තුව සඳහා පමණක් (අප්‍රේල් 01 සිට ජූනි 30 දක්වා) වන අතර එය 75% කි. පළමු කාර්තුවේ ප්‍රගතිය පිළිබඳ විස්තර ලබා දී නොමැත.<br><br>ලබා දී ඇති තොරතුරුවල පරස්පර විරෝධී ස්වභාවය හේතුවෙන් එම ලබා දුන් තොරතුරු වසරේ පළමු අර්ධය තුළ සමුච්චිත ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීය. | |

| | | | |
|---|---|---|---|
| රැඳවියන් සඳහා සනීපාරක්ෂක පහසුකම් | **සාධනීය**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර ඊට අදාළ තොරතුරු 2023 අගෝස්තු 18 දින ලැබිණ. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14කට පසුව එහෙත් දින 21ක් ඇතුළත විය. එලෙස ලබා දෙන ලද තොරතුරු ප්‍රගතිය ඇගයීමට තරම් ප්‍රමාණවත් නොවීය. | **මන්දගාමී ප්‍රගතියක් ඇත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලද ප්‍රතිචාරයට අනුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අයවැය ශීර්ෂ 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව (232-1-01) යටතේ 'බන්ධනාගාර රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම' වෙනුවෙන් රු. මිලියන 200ක් වෙන් කර තිබේ. මෙම වෙන් කිරීමට අමතරව, 2023 අයවැය කතාව මගින් අමතර රු. මිලියන 100ක් ද වෙන් කර තිබේ. එසේම, මෙම යෝජනාවට අදාළ කාර්තුමය භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත්ව 2023 වසර සඳහා කාර්ය සැලැස්මක් පිළියෙළ කොට තිබේ. ලැබී ඇති තොරතුරුවලට අනුව, 2023 ජූනි මාසය අග දක්වා පිහිටුවා ඇති භෞතික ඉලක්කය 40%ක් වන අතර එම කාලය සඳහාම වන මූල්‍ය ඉලක්කය රු. මිලියන 150කි.<br><br>ජූනි මාසය අග දක්වා පිහිටුවන ලද ඉලක්කවලට සාපේක්ෂව තක්සේරු කිරීම උදෙසා ජූනි අග දක්වා ප්‍රගති තොරතුරු ඉල්ලා ඇතත් ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ලද ප්‍රගති වාර්තාවලින් ආවරණය වී ඇත්තේ 2023 ජූලි 31 දක්වා කාල පරිච්ඡේදය පමණි. ඉලක්ක කාල රාමුව (ජූනි) සහ සත්‍ය ප්‍රගති වාර්තා දිනය (ජූලි අග) අතර ඇති පරස්පරතාව හේතුවෙන් 2023 ජූනි මාසයට අදාළව මෙම යෝජනාවෙහි ප්‍රගතිය ඇගයීමට සාධ්‍යතාවක් නොපැවතිණ. මේ නිසා අප විසින් ජූලි මාසය දක්වා ප්‍රගතිය පාදක කර ගනිමින් ප්‍රගති තක්සේරුවක් සිදු කරන ලද අතර ඒ අනුව මෙම යෝජනාවේ ප්‍රගතිය කාණ්ඩගත කරන ලදි. ලැබී ඇති තොරතුරුවලට අනුව, යෝජනාව යටතේ ඇති ඇතැම් නිශ්චිත කාර්යයන්හි ප්‍රගතිය ජූලි මාසය දක්වා වන කාල පරිච්ඡේදය දක්වා වාර්තා කර නොමැති අතර අනුමැතීන් ලබා ගැනීම හා ඇස්තමේන්තු පිළියෙළ කිරීම වැනි ප්‍රාරම්භක කාර්යයන්, ක්‍රියාත්මක කිරීමට පෙරාතුව සිදු කරමින් පැවැති බව සඳහන් කෙරී ඇත. පොරොන්දුව ක්‍රියාත්මක කිරීමෙහිලා අවම ප්‍රගතියක් වාර්තා වී ඇති බවක් මින් අදහස් වේ. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව |
| වෛද්‍යවරුන් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා | **ආවෘත**<br><br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 ජූලි 26 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, පසු විපරම් කිහිපයක්ම සිදු කරන ලද නමුදු අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | **හෙළිකර නැත**<br><br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | අධ්‍යාපන අමාත්‍යාංශය |

## නියාමන යෝජනා

| අයවැය පොරොන්දුව | විවෘතභාවයේ කාණ්ඩය | ප්‍රගති කාණ්ඩය | රජයේ නියෝජිතායතනය |
|---|---|---|---|
| ගෝලීය වෙළෙඳපොළවල් ප්‍රවේශය වැඩි දියුණු කිරීම | ආවෘත | හෙළිකර නැත | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>ජනාධිපති කායාීලය |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පළ කරන ලද පුවත් නිවේදනයකට අනුව, 2023 අගෝස්තු 08 වන දින ආසියාන් සංවිධානයේ 56 වන සංවත්සරය ආමන්ත්‍රණය කරමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කර ඇත්තේ කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරත්වය (RCEP) හා සම්බන්ධ වීමට ශ්‍රී ලංකාවට අභිලාෂයක් ඇති බවත් ආසියාන් සාමාජික රටවල් සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමට සැලසුම් ඇති බවත් ය. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පළ කර ඇති තවත් පුවත් නිවේදනයකට අනුව ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතා සඳහන් කර ඇත්තේ නිදහස් වෙළෙඳ ගිවිසුම් හා සම්මුතිගත වීම නැවත ආරම්භ කිරීම රජයේ අභිලාෂය වන බවයි. එමෙන්ම ඒ මහතා අනාගතයේදී ජාත්‍යන්තර වෙළෙඳ සම්මුතීන් සියල්ලම සමඟ කටයුතු කිරීමට අපේක්ෂිත ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලයක් පිහිටුවීමේ අයවැය යෝජනාව වෙතද අවධානය යොමු කොට තිබේ.<br><br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය හඳුනා ගෙන ඇත. ඒ අනුව, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් 2023 අගෝස්තු 10 වන දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදි. කෙසේ වෙතත්, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෙම ඉල්ලීම 2023 සැප්තැම්බර් 06 දිනැති ලිපියක් මඟින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත්තේ එම තොරතුරු එකී අමාත්‍යාංශයට අදාළ බව සඳහන් කරමිනි. ඉල්ලා ඇති තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය පරාසයට අයත් බව සඳහන් කරමින් මුදල් අමාත්‍යාංශය විසින් 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපියක් මඟින් එම ඉල්ලීම නැවතත් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කොට ඇත. එතැන් සිට ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩිදුර ප්‍රතිචාරයක් ලැබී නොමැත. | කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | |

| බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව | ආවෘත | හෙළිකර නැත | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| --- | --- | --- | --- |
| | මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය හඳුනා ගන්නා ලදි. ඒ අනුව, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් 2023 අගෝස්තු 10 වන දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදි. කෙසේ වෙතත්, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෙම ඉල්ලීම 2023 සැප්තැම්බර් 06 දිනැති ලිපියක් මඟින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත්තේ එම තොරතුරු එකී අමාත්‍යාංශයට අදාළ බව සඳහන් කරමිනි. ඉල්ලා ඇති තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය පරාසයට අයත් බව සඳහන් කරමින් මුදල් අමාත්‍යාංශය විසින් 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපියක් මඟින් එම ඉල්ලීම නැවතත් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කොට ඇත. එතැන් සිට ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩිදුර ප්‍රතිචාරයක් ලැබී නොමැත. | කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |

| දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීම | සාධනීය | සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත | තාක්ෂණ අමාත්‍යාංශය |
|---|---|---|---|
| | 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත අන්තර්ජාලය හරහා ලබා ගත හැක. එසේම, දත්ත ආරක්ෂණ අධිකාරය පිහිටුවීමට අදාළ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ V කොටස ක්‍රියාත්මක කිරීමට අදාළ 2023 ජූලි 21 දින නිකුත් කරන ලද අංක 2341/59 දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනයද අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැක.<br><br>2023 අගෝස්තු 10 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලද අතර 2023 අගෝස්තු 25 දින ඊට අදාළ තොරතුරු ලැබිණ. ඒ, එම ඉල්ලීම ගොනු කිරීමෙන් දින 14ක් ඇතුළත ය. ලබා දුන් තොරතුරු ප්‍රගති ඇගයීමක් සිදු කිරීම සඳහා අදාළ හා ප්‍රයෝජනවත් විය. | 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැක. දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමට ප්‍රතිපාදන එහි ඇතුළත් බව එම පනතෙහි සඳහන් වන අතර එහි අධ්‍යක්ෂණ මණ්ඩල ව්‍යවස්ථාවට අදාළ විධිවිධානද ඊට ඇතුළත් ය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයෙන් ලද ප්‍රතිචාරයට අනුව 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ලෙස පරිවර්තනය කිරීමට ඉඩකඩ සලසමින් 2022 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් පුද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත අනුමත කරන ලදි. එසේම, 2023 ජූලි 21 දිනැති අංක 2341/59 දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කිරීම තුළින් දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීමට අදාළ වන 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ V කොටස ක්‍රියාත්මක කිරීම රජය විසින් අරඹන ලදි. මේ නිසා, මෙම යෝජනාව නෛතික බලාත්මක කිරීමක් ලෙස ක්‍රියාත්මක කර ඇති අතර අවශ්‍ය වන නියාමන දැනුම් දීම (ගැසට් නිවේදනය) යෝජනාවෙහි සමස්ථ පරාසයට අදාළවම පළ කොට තිබේ.<br><br>මීට අමතරව, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට ලද ප්‍රතිචාරයෙන් තවදුරටත් සඳහන් වූයේ දත්ත ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂණ මණ්ඩලය පත් කිරීම, විශේෂයෙන්ම ඉහත කී ගැසට් නිවේදනයේ V කොටසෙහි දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළව අතිගරු ජනාධිපතිවරයාගේ අධිකාරිත්වය යටතේ සිදු කරන ලද බවයි. මෙම අධිකාරිය නිල වශයෙන් පිහිටුවීමට අදාළව බැලීමේදී එය 2023 සැප්තැම්බර් 19න් පසුව ක්‍රියාත්මක වීම මන්දගාමී වී ඇති බවයි. | |

| | | | |
|---|---|---|---|
| නව මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පනත | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>ජූනි මාසය අග වන විට මෙම ස්වරූපයේ කෙටුම්පතක් හෝ පනතක් පාර්ලියේමේතුවේ විවාදයට ලක් වී හෝ ප්‍රකාශයට ලක් වී නොමැත.<br><br>2023 අගෝස්තු 10 වැනි දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. එවැනි තොරතුරු හෙළිදරව් කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බරපතල පක්ෂග්‍රාහීත්වයක් ඇති වීමට ඉඩ ඇත යන පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදි. ඒ අනුව, මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය තොරතුරු නොලැබිණ. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | ශ්‍රී ලංකා මහ බැංකුව |
| අයවැය යෝජනා අධීක්ෂණය කිරීම සඳහා වන කාර්‍ය සාධන බලකාය | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය හඳුනා ගෙන ඇත. ඒ අනුව, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් 2023 අගෝස්තු 10 වන දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදි. කෙසේ වෙතත්, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෙම ඉල්ලීම 2023 සැප්තැම්බර් 06 දිනැති ලිපියක් මඟින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත්තේ එම තොරතුරු එකී අමාත්‍යාංශයට අදාළ බව සඳහන් කරමිනි. ඉල්ලා ඇති තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය පරාසයට අයත් බව සඳහන් කරමින් මුදල් අමාත්‍යාංශය විසින් 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපියක් මඟින් එම ඉල්ලීම නැවතත් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කොට ඇත. එතැන් සිට ඒ සම්බන්ධයෙන් කිසිදු වැඩිදුර ප්‍රතිචාරයක් ලැබී නොමැත. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br><br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරියක් ස්ථාපනය කිරීම | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 10 වැනි දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. එවැනි තොරතුරු හෙළිදරවු කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බරපතල පක්ෂග්‍රාහීත්වයක් ඇති වීමට ඉඩ ඇත යන පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදි. ඒ අනුව, මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය තොරතුරු නොලැබිණ. | **හෙළිකර නැත**<br>කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ප්‍රගාමීව හෝ තොරතුරු දැනගැනීමේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් නොලැබුණි. තොරතුරු නොමැති වීම හේතුවෙන් මෙම යෝජනාවෙහි ප්‍රගතිය තක්සේරු කිරීමට නොහැකි විය. | ශ්‍රී ලංකා මහ බැංකුව |
| නව කම්කරු ප්‍රතිපත්ති | **ආවෘත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>2023 අගෝස්තු 10 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන ලදි. කෙසේ වෙතත්, නව සේවක පනතක් කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණයක් මෙතෙක් ගෙන නොමැති බව දක්වමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදි. | **ක්‍රියාත්මක කර නැත**<br>මෙම පොරොන්දුවෙහි ප්‍රගතිය ඇගයීම සඳහා කිසිදු තොරතුරක් අන්තර්ජාලය ඔස්සේ ලබා ගත නොහැකි විය.<br><br>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වෙතින් ලද ප්‍රතිචාරයට අනුව සඳහන් කෙරුණේ නව සේවක පනතක් කෙටුම්පත් කිරීම සම්බන්ධ අවසන් තීරණයක් මේ දක්වා ගෙන නොමැති බවයි. ඒ අනුව ගම්‍ය වන්නේ මෙම යෝජනාව මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බවයි. | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය |

## වගකීම්හරණය

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු රජයේ වාර්තා, නිල ප්‍රකාශන, මහජන වාර්තා සහ තොරතුරු දැන ගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් ඔස්සේ ලැබෙන තොරතුරු ඇසුරින් සම්පාදනය කර ඇත. මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු වෙරිටේ රීසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයින්ගේ හෝ පෞද්ගලික අදහස් හෝ මතය පිළිබිඹු නොකරයි. වේදිකාවේ ඇතළත් තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස සිදුවිය හැකි හෝ එසේ වූ බවට කියැවෙන කිසිදු අලාභයකට හෝ කීර්ති නාමයට හානි කිරීම ඇතුළුව කිසියම් අලාභයක් හෝ හානියක් සඳහා වෙරිටේ රීසර්ච් ආයතනය කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ.

මෙම වේදිකාවේ පළ කර ඇති තොරතුරු විශ්වාසදායක ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇති බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර, තොරතුරුවල ඇති කිසිදු දෝෂයකට, මගහැරීමකට හෝ එම තොරතුරු භාවිතයෙන් ලබාගත් ප්‍රතිඵල සඳහා හෝ වෙරිටේ රීසර්ච් සහ Home - Public Finance Sri Lanka Dashboards | Budget Promisesකණ්ඩායමෙහි සාමාජිකයින් වගකිව යුතු නොවේ. වෙරිටේ රීසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව මෙම වේදිකාවේ අන්තර්ගතයන් වෙනස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම, සම්ප්‍රේෂණය කිරීම, හුවමාරු කිරීම, විකිණීම, පිටපත් කිරීම, ව්‍යුත්පන්න කෘති නිර්මාණය කිරීම, බෙදා හැරීම, නැවත පළ කිරීම, රඟ දැක්වීම, ප්‍රදර්ශනය කිරීම සහ කිසිදු ආකාරයකින් වාණිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා පරිශීලකයින්ට අවසර නොමැත.

එමෙන්ම, වෙරිටේ රීසර්ච්හි පූර්ව අවසරය ඇතිව හෝ නැතිව, පූර්වයෙන් ලබාගත් තොරතුරක් පසුකාලීනව භාවිතා කිරීමෙන් උද්ගතවන ප්‍රතිඵල සඳහා budgetpromises.org වගකිව යුතු නොවේ.

budgetpromises.org කිසිදු දේශපාලන පක්ෂයක් සහ / හෝ දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත සංවිධානයක් වෙත සහය දැක්වීම, අනුමත කිරීම, නියෝජනය කිරීම සහ ඒ සමඟ සම්බන්ධ වීම ආදිය සඳහා කටයුතු නොකරයි. විශ්ලේෂණ සඳහා භාවිතා කෙරෙන දර්ශක හුදෙක් කාර්ය සාධනයේ සංඛ්‍යානමය අනුමානයන් පමණකි.

මෙම වේදිකාවේ ඇතුළත් තොරතුරු පරිශීලකයින් දැනුවත් කිරීම සඳහා නොමිලයේ  සපයනු ලැබේ. එම තොරතුරු සැපයීම සම්බන්ධයෙන් වෙරිටේ රීසර්ච් හෝ budgetpromises.org කණ්ඩායමේ සාමාජිකයින් සහ කිසියම් පරිශීලකයෙකු අතර එකඟතාවයක් හෝ අවබෝධතාවක්  නොපවතී.

මෙම වේදිකාව, දත්ත මගින් ප්‍රදර්ශනය කෙරෙන ප්‍රවණතා දැක්වීමට සහ ඒවා පිළිබිඹු කිරීමට budgetpromises.org විසින් සකස් කරන ලද ස්වාධීන විශ්ලේෂණ ලිපිවලින් සමන්විත වේ. එවැනි විශ්ලේෂණ ලිපි පිටපත් කිරීම වෙරිටේ රීසර්ච් හි පූර්ව අවසරය ඇතිව සිදු විය යුතුය.